# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,937/6 — 1970 දෙසැම්බර් 23 වැනි බදාදා — 1970.12.23**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය


(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී. 47/53

### අමාත්‍යවරුන්ගේ කාර්යයන් පැවරීමේ (ආනුෂංගික විධිවිධාන) පනත

2 වැනි වගන්තිය යටතේ ආඥාව

මුදල් ඇමතිවරයා වෙත කලින් පවරා තිබුණු " රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් " යන විෂයය 1970 ජූනි මස 2 වැනි දින අංක 14,908/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජ සභා ආඥාවේ 46(4) වැනි වගන්තිය යටතේ අගමැතිනිය විසින් කරන ලද පැවරීමෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා වෙත දැන් පවරා ඇති හෙයින්ද,

ඒ පැවරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් ලිඛිත නීතියක් සංශෝධනය කිරීම අවශ්‍ය වී ඇති හෙයින්ද,

අගමැතිනි සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම, (385 වැනි අධිකාරිය වන) අමාත්‍යවරුන්ගේ කාර්යයන් පැවරීමේ (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයේ I වැනි තීරයේ දක්වා ඇති ලිඛිත නීති, ඒවාට අනුරූපව එම උපලේඛණයේ II වැනි තීරයේ දක්වා ඇති ආකාරයට හා ප්‍රමාණයට මෙම ආඥාවෙන් සංශෝධනය කරමි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අගමැතිනි.

1970 දෙසැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛණය

| I වැනි තීරය | II වැනි තීරය |
| --- | --- |
| (434 වැනි අධිකාරය වන) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත | (අ) 3 (2) වැනි, 15 වැනි, 24(2) වැනි සහ 27(1) වැනි වගන්තිවල " මුදල් ඇමතිවරයා " යන පාඨය වෙනුවට " රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා " යන පාඨය ආදේශ විය යුතුය. |
| | (ආ) 26(1) වැනි සහ (2) වැනි වගන්තියේ " භාණ්ඩාගාරයේ ලේකම් " යන පාඨය යෙදෙන කවර ස්ථානයක වුවද, එම පාඨය වෙනුවට " රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් " යන පාඨය ආදේශ විය යුතුය. |
| | (ඇ) 2(2) වැනි, 3(1) (අ) වැනි, 3(3) වැනි, 9 වැනි, 13 (2) (ii) වැනි, 22 වැනි, 24 (i) වැනි සහ 25 වැනි වගන්තිවල " භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් " යන පාඨය වෙනුවට " විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ " යන පාඨය ආදේශ විය යුතුය. |
| | (ඈ) 17 වැනි වගන්තියේ " භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් " යන පාඨය යෙදෙන කවර ස්ථානයක වුවද, එම පාඨය වෙනුවට " විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ " යන පාඨය ආදේශ විය යුතුය. |

12–1116


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි

952/9——ජේ 19906—11,005 (70/12)